

# ශ්‍රී ලංකාව: නිවරදි මාවත තෝරා ගත යුතුයි

**වින්දිතයින්ට යුක්තිය සත්‍යය සහ හානිපූර්ණය ලබා දෙන සාධනීය යාන්ත්‍රණයක් පිහිටුවීම**

AMNESTY INTERNATIONAL

ඇම්නස්ටි  ජාත්‍යන්තරය ලොව පුරා සියලු දෙන සමානව  මානව හිමිකම් භුක්ති විඳීම උදෙසා මිලියන 7ක් ජනතාව උද්ඝෝෂණය යේ යෙදෙන ගෝලීය මහජන ව්‍යාපාරයකි.

අපගේ දැක්ම වන්නේ විශ්වීය මානව හිමිකම් ප්‍රඥප්තියේ හා අනෙකුත් මානව හිමිකම් සම්මතයන් ගේ අන්තර්ගත කර ඇති සියලු අයිතීන් සෑම පුද්ගලයෙකුම සපුරා භුක්ති විඳිමයි.

අප සියලු රජයන්ගෙන්, දේශපාලන දෘෂ්ඨීන්ගෙන් ආර්ථික අභිලාෂයන්ගෙන් හෝ ආගම් වෙතින් වියුක්ත, අපගේ සාමාජිකයින් හා මහජන ප්‍රදානයන් ගෙන් අරමුදල් සැපයෙන ස්වාධීන ආයතනයකි.

© ඇම්නස්ටි  ජාත්‍යන්තරය 2016
පැහැදිලිව සටහන් කර නොමැත්තේ නම් මෙම  ලේඛනයේ  අන්තර්ගත කරුණු ක්‍රියේටිව් කොමන්ස් (පොදු නිර්මාණශීලි) යටතේ ලියාපදිංචිය ලබා  ඇත.
(ආරෝපිත, වාණිජ්‍ය නොවෙන, ආංශික නොවෙන, අන්තර්ජාතික 4.0)
https://creativecommons.org/licenses/by-nc-nd/4.0/legalcode
වැඩිදුර විස්තර සඳහා කරුණාකර අපගේ වෙබ් අඩවියේ අවසර ලබා ගැනීම ගැන වෙබ් පිටුවට පිවිසෙන්නඃwww.amnesty.org
ඇම්නස්ටි ජාත්‍යන්තරය නොවෙන අන් අයෙකුගේ ආරෝපිත නිර්මාණ අයිතිය සඳහා ක්‍රියේටිව් කොමන්ස් ලියාපදිංචිය බලපාන්නේ නැත.
2016 මුල් වරට මුද්‍රාපිතයි
සීමිත ඇම්නස්ටි ජාත්‍යන්තරය.
පීටර් බෙනෙන්සන් හවුස්, 1 ස්ටන් ස්ට්‍රීට්
ලන්ඩන් WC1X 0DW, UK

*සූචිය:* **ASA 37/4456/2016**
**මුල් බස : ඉංගිරිසි**

**amnesty.org**

AMNESTY INTERNATIONAL

# 1 සාරාංශයඃ

2015 ඔක්තෝබර් මස එක්සත් ජාතීන් ගේ මානව හිමිකම් කවුන්සිලය විසින් 30/1 දරන යෝජනාවට ශ්‍රී ලංකාව සම අනුග්‍රහය දැක්වීමෙන් බලධාරින් අවසානයේ දී දිර්ඝ කාලයක් තිස්සේ ශ්‍රී ලංකාව තුළ ගොඩ නැගි ඇති මානව හිමිකම් උල්ලංඝණයන් සම්බන්ධ වැරදි වලට දඩුවම් නොකර සිටිමේ දුෂ්ඨ චක්‍රය අවසාන කිරිමට කාලය එළඹ ඇතැයි පිළි ගැනිමකී. මේ සම්බන්ධයෙන් වෙනසක් කිරිමේ දැඩි බලාපොරොත්තු සහිතව ජාත්‍යයන්තර නිතීය අනුව අතීත වැරදි වලට විභාග කිරිම, ශ්‍රී ලංකිකයන් විසින් අත් විදින ලද වේදනාවන් සමනය කරනු පිණිස සත්‍ය ගවේෂණය කිරිම, එවැනි සිදුවිම් නැවත සිදු නොවිම සහතික කරන ප්‍රතිසංස්කරණයන් ඇති කිරිම වැනි කාරණා ඇතුලත් න්‍යාය පත්‍රයක් රජය පිළි ගෙන තිබේ. මෙම කාර්යභාරය භාර ගැනිමේ වැදගත්කම අතිශයෝක්තියෙන් දැක්විය නොහැක. ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානය වසර හතලික් පමණ තිස්සේ ශ්‍රී ලංකාව මානව හිමිකම් උල්ලංඝණයන් පිළිබඳව නියාමනය කරමින් වාර්තා කරයි. මෙම කාල පරිච්ඡේදය තුල සාහසික දේශපාලන කැරලි හා ආන්ඩුවේ හමුදාව හා එල් ටි ටි ඊ සංවිධානය සමග දිග්ගැස්සුන යුද්ධයක් ඇති විම, මෙන්ම ඇතැම් විට රජය විසින් මෙම අභියෝග වලට ඉතාමත් කෘෘර ලෙස ප්‍රතිචාර දැක්විම දක්නට ලැබුණි. මෙම ක්‍රියාදමය තුල අපගේ අවධානය යොමු වුයේ මහජන ආරක්ෂාවේ නාමයෙන් සිදු වු වැරදිකරුවන්ට දඩුවම් නොදිමේ රාජ්‍ය පිළිවෙත කෙරෙහිය.[1]

පසුගිය කාලය තුළ මෙකී මානව හිමිකම් උල්ලංඝණය කිරිම් සම්බන්ධයෙන් වගකිම බාර ගැනීම, සිදු වු වැරදි සම්බන්ධයෙන් විමර්ශනය කිරිම මෙන්ම අධිචෝදනා බාර දිම හෝ වින්දිතයින් වෙනුවෙන් එළදයි සහන සැලසීමක් සිදු නොවිය. තවද මානව හිමිකම් ආරක්ෂකයින් හා ජනමාධ්‍ය වෙත නොකඩවාම එල්ල කරන ලද පෙරලා පහර දිම් යන කාරණා මත ශ්‍රී ලංකාව විසින් ද පිළි ගෙන ඇති ජාත්‍යයන්තර නිතීයට අනුව, සිදු වුයේ යැයි කියන යුද්ධ අපරාධ ඇතුළු අනෙකුත් චෝදනා විමර්ශනය කිරිමට අන්තර් ජාතික නිතීය යටතේ පවත්වනු ලබන ජාත්‍යයන්තර පරික්ෂණයක අවශ්‍යතාවය ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානය ඇතුළු ජගත් මානව හිමිකම් සංවිධාන කලක සිට පෙන්වා දෙන ලදී. 2014 මාර්තු මාසයේ දී එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය විසින් ඉදිරිපත් ව ඇති චෝදනා සම්බන්ධයෙන් විමර්ශනය කිරිමටත් පෙරලා එවැනි මානව හිමිකම් උල්ලංඝණයන් සිදු නොවන තැනට කටයුතු කිරිමටත් ක්‍රියා කරන ලෙසට මානව හිමිකම් මහ කොමසාරිස්වරයා ගෙන් ඉල්ලා සිටියේය.[2]

2015 ජනවාරි මස ඇති වු ආණ්ඩු වෙනස් විමට සමගාමිව එක්සත් ජාතීන් ගේ සංවිධානය හා විවෘතව කටයුතු කිරිම ආරම්භ වීම එක්සත් ජාතීන් ගේ සංවිධානය ඇතුළු ජගත් ප්‍රජාව සමඟ ඉදිරියට ගමන් කිරිමක් සනිටුහන් කිරිමක් වුයේය. මෙම සහසම්බන්ධතාවය මගින් වාර්ගික සංහිඳියාව ගොඩ නැගීම, මානව හිමිකම් ප්‍රවර්ධනය කොට ආරක්ෂා කිරිම පිණිස

[1] 1971 හා යලිත් 1989-1990 කාල වකවානුවේදී ජනතා විමුක්ති පෙරමුණ විසින් දියත් කරන ලද කැරලි එකල පැවති ආණ්ඩු විසින් ඉතාමත් නිර්දය ලෙස මර්දනය කරන ලද්දේය. එහි ප්‍රතිඵලයක් වශයෙන් දහස් ගණනක් මිය ගිය අතර තවත් 30,000-60,000 අතර ඇස්තමේන්තු ගත සංඛ්‍යාවක් බලහත්කාරයෙන් අතුරුදහන් කරන ලද්දේය. තවත් දහස් ගණනක් රඳවා තැබූ අතර ඔවුන් ගේ බොහෝ දෙනෙක් විවිධ වධහිංසා වලට භාජනය වුයේය. 1983 ජුලි මස සිට 2009 මැයි මාසය දක්වා ද්‍රවිඩ ඊළාම් විමුක්ති කොටි සංවිධානය හා ආණ්ඩුවේ හමුද අතර ඇති වු ආයුධ සන්නද්ධ ගැටුමේ දීත් දෙපාර්ශවය විසින් ම සිවිල් වැසියන් ඝාතනය කිරිම, සිවිල් වැසියන් විශේෂයෙන්ම ජාතිකත්වය හා උපන් ස්ථානය මත බලහත්කාරයෙන් රඳවා තබා ගැනීම, වධහිංසා පැමිණවීම, බලහත්කාරයෙන් අතුරුදහන් කිරිම හා නඩු විභාගයකින් තොර ඝාතන නිසා දෙපාර්ශවය විසින්ම ජාත්‍යයන්තර නීතියට මෙන්ම මානව සංහතියට එරෙහිව ද අපරාධ සිදු කරන ලද්දේ යැයි දෙපාර්ශවයටම චෝදනා එල්ල කරනු ලැබේ.

[2] මානව හිමිකම් කවුන්සිලයේ යෝජනාව 30/1ඃ 'ශ්‍රී ලංකාවේ මානව හිමිකම් ප්‍රවර්ධනය වගවිම හා සංහිඳියාව' A/HRC/RES/30/1- 14/10/2015

අත්‍යාවශ්‍ය ආයතනයන් හි ස්වාධීනත්වය යලි පිහිටුවිම හා බිඳ වැටුන ජාත්‍යයන්තර සම්බන්ධතා යලි ස්ථාපිත කිරිම අපේක්ෂිතය[3].

30/1 යෝජනාවත් සමගම ශ්‍රී ලංකාව එක්සත් ජාතීන් ගේ සංවිධානයත් සමඟ මෙරට අතීත සිදුවීම් පිළිබඳව පුළුල් ලෙස කටයුතු කිරීමේ වගකීමෙන් බැඳීන. මීට පහත සඳහන් කරුණු ඇතුලත්ය.

1- මානව හිමිකම් උල්ලංඝණය කිරිම හා අවභාවිතය පිළිබඳ චෝදනා මෙන්ම අන්තර් ජාතික නිතීය යටතේ ගැනෙන අපරාධ විමර්ශනය කිරිම පිණිස (එක්සත් ජාතීන් ගේ) විශේෂ නියෝජිතයෙකු සහිත අධිකරණ යාන්ත්‍රණයක් පිහිටුවීම
2- සත්‍යය යුක්තිය හා සංහිඳියාව පිණිස කොමිෂන් සභාවක් පත් කිරිම
3- අතුරුදහන් වුවන් ගේ කාර්යාලයක් පිහිටුවිම
4- හානිපුරණය පිණිස කාර්යාලයක් පිහිටුවිම[4]

ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානය මෙම කැපවිම ඉතාමත් අගය කරන්නේ මෙම අංග අනාගත ශ්‍රී ලංකිකයින් ගේ මානව හිමිකම් ආරක්ෂා කිරිම ශක්තිමත් කිරිමට පමණක් නොව වරදින් නිදහස් ව සිටිම ඇතුළු අතීතයේ සිදු වු මානව හිමිකම් උල්ලංඝණයන් සඳහා යුක්තිය ඉටු කිරිමට ද ඒවා ඉවහල් වන බැවිනි.

එක්සත් ජාතීන් ගේ 30/1 යෝජනාව සම්මත වි වසරක් ගෙවි ගොස් ඇති අතර ශ්‍රී ලංකා රජය යුක්තිය, සත්‍ය ගවේෂණය, හානිපුරණය හා යලි මෙවැනි සිදුවීම් සිදු නොවන තැනට වග බලා ගැනිම පිණිස යම් කැප විමක් පෙන්වයි. සංහිඳියාව ගොඩ නැගිම සඳහා ප්‍රචාරණ ක්‍රියාවලියක් ආරම්භ කිරිම, සියළු තැනැත්තන් බලහත්කාරයෙන් අතුරුදහන් විමෙන් ආරක්ෂා කරන විශ්ව සම්මුතියට අත්සන් කිරිම, අතුරුදහන් වුවන් පිළිබඳ සොයා බලන කොමිසන් සභාව සඳහා වු කාර්යාලයක් පිහිටුවිම යන කාරණා සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව යම් ප්‍රගතියක් ලබා තිබේ.

කෙසේ වෙතත් ශ්‍රී ලංකික සිවිල් සමාජ කණ්ඩායම් හා වින්දිතයින් මානව හිමිකම් කේෂත්‍රයේ සිදුවන ප්‍රගතිය සම්බන්ධයෙන් සෑහිමකට පත් නොවේ. ඊට හේතුව ඇතැම් ක්‍රියා මාර්ගයන් හි විනිවිද භාවයක් නොමැති විම, ප්‍රමාණවත් ප්‍රතිපාදන වෙන් නොකිරිම සහ මහජනයා අතර මෙම ක්‍රියාවලිය සම්බන්ධයෙන් ඒකමතිකභාවයක් නොවිම ලෙස ඵලකනු ලැබේ.

මෙම සංක්ෂිප්ත වාර්තාව ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානයේ විශ්ලේෂණාත්මක නිර්දේශ අඩංගු වන අතර, එමගින් යුක්තිය, සත්‍යය හා හානිපුරණය සහතික කරන සාධනීය යාන්ත්‍රණයක් පිහිටුවිමට ඉවහල් වනු ඇතැයි අපේක්ෂා කරයි. මෙම වාර්තාව කොටස් පහකින් යුක්තය. පළමුවන කොටසට ඉහත කී යාන්ත්‍රණයන් සතර පිහිටුවිමේ දී පාදක කර ගත හැකි මුලධර්ම දහයක් හඳුන්වා දෙයි. ඉතිරි කොටස් හතර වෙන් වෙන් වශයෙන් ඒ ඒ යාන්ත්‍රණය සඳහා මෙම මුලධර්ම ඉවහල් වන ආකාරය පෙන්වා දෙයි.

# ක්‍රමවේදයඃ

මෙම වාර්තාව පිළියෙළ කිරිමේ දී දශක ගණනාවකට පසු ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානයට ශ්‍රී ලංකාවට පැමිණි අතර එම සංචාරයේ දී රාජ්‍ය නිලධාරීන් ගණනාවක් මුණ ගැසිම මෙම වාර්තාව පිළියෙළ කිරිමේ දී මහඟු අනුබලයක් විය.[5] මෙම සාකච්ජා වල මුලික අරමුණ වුයේ ශ්‍රී ලංකාවේ මානව හිමිකම් වගවීම පිළිබඳ කැප විම සාකචජා කිරිමයි.

[3] 2015 ජනවාරි මස පැවති ජනාධිපතිවරණයේ දී මහින්ද රාජපක්ස පරාජය කොට මෛත්‍රීපාල සිරිසේන ජනාධිපති ධුරයට පත් විය

[4] මානව හිමිකම් කවුන්සිලයේ යෝජනාව 30/1: 'ශ්‍රී ලංකාවේ මානව හිමිකම් ප්‍රවර්ධනය වගවිම හා සංහිඳියාව' A/HRC/RES/30/1- 14/10/2015

[5] . අන්තර් කාලපරිච්ජේදයේ දී ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානය ශ්‍රී ලංකාවේ මානව හිමිකම් ක්‍රියාධරයින් හා වින්දිතයින් සමග ඉතා කිට්ටු සම්බන්ධතාවයක් පවත්වා ගෙන ශ්‍රී ලංකාවේ තත්වය පිළිබඳ මනා අවබෝධයක් ඇති කර ගැනිමට සමත් වුයේය

ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානයේ නියෝජිතයින් 2015 දෙසැම්බර් හා 2016 මාර්තු යන මාස වල ශ්‍රී ලංකාවේ සංචාරය කළ අතර එම සංචාර වලදී රාජ්‍ය නිලධාරීන් මානව හිමිකම් ප්‍රවර්ධනය හා වරදින් නිදොස් ව සිටින තැනැත්තන් අධිකරණය හමුවට ගෙන ඒමට රාජ්‍ය නිලධාරීන්ට උපකාරිවන  උපදේශකයින් නිතී ක්ෂේත්‍රයේ නියෝජිතයින් සිවිල් සමාජ සංවිධාන නියෝජිතයින් මානව හිමිකම් වින්දිතයින් සමඟ ද තොරතුරු හුවමාරු කර ගන්නා ලදී. මෙම හමුවීම් කොළඹ මඩකලපුව මන්නාරම මුලතිව් පුත්තලම වවුනියාව යන නගර වලදි පවත්වනු ලැබීය.

අපගේ නියෝජිතයින් රැස්වීම් හැටක් පමන පැවැත් වු අතර ඊට යුක්තිය සත්‍යය හානිපුරණය හා යලි මෙවැන්නක් සිදුනොවන බවට වගබලා ගන්නා පුද්ගලයින් මෙන්ම කන්ඩායම් ද ඇතුලත් විය.

මෙම සංක්ෂිප්ත වාර්තා 2016 ජුනි මස ශ්‍රී ලංකාවේ සංහිඳියා යාන්ත්‍රණය පිලිබඳ පිහිටුවන ලද උපදේශාත්මක කාර්ය සාධක කමිටුවට ඉදිරිපත් කරන ලද වාර්තාව පදනම් කොට ගෙන පිළියෙළ කරන ලදී.

**ඇම්නෙස්ටි ජාත්‍යන්තරය මානව හිමිකම් සඳහා වන ගෝලීය මහජන ව්‍යාපාරයකි.**
**ඔබ් පුද්ගලයෙකුට අසාධාරණයක් සිදු වන විට, එය අප සියලු දෙනාටම බලපාන ගැටළුවකි.**


CONTACT US

info@amnesty.org

+44 (0)20 7413 5500


JOIN THE CONVERSATION

www.facebook.com/AmnestyGlobal

@AmnestyOnline

# ශ්‍රී ලංකාව: නිවැරදි මාවත තෝරා ගත යුතුයි

## වින්දිතයින්ට යුක්තිය සත්‍යය සහ හානිපූර්ණය ලබා දෙන සාධනීය යාන්ත්‍රණයක් පිහිටුවීම

ශ්‍රී ලංකාව එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සලයේ 30/1 සම්මුතිය ට 2015 ඔක්තෝබර් මස සම අනුග්‍රහය දැක්වූවිට, අවසානයේ ශ්‍රී ලංකාවේ අධිකාරීන් දිගු කාලීනව පැවති ප්‍රචණ්ඩත්වය හා මානව හිමිකම් උල්ලංඝනය කිරීමට පැවති මුක්තිය  හඳුනාගත් බව පෙනී ගියේය. ශ්‍රී ලංකාවේ රජය ජාත්‍යන්තර නීතිය උල්ලංඝනය කරමින් කෙරුණු අතීත අපරාධ කෙරේ යුක්තිය ප්‍රදානය කිරීම, හිංසනයට මුහුණ දුන් අයට සත්‍යය හා  හානි පූරණය මගින් ශ්‍රී ලංකාවේ ජනයාට සිදුවූ හානීන් සඳහා  පිළියම් කිරීම හා පුනරාවර්තනය වැළැක්වීම සඳහා අවශ්‍ය ප්‍රතිසංස්කරණ කිරීම  ඇතුළත් උන්නතිකාමී න්‍යාය පත්‍රයකට අනුව වෙනස් වීමේ ක්‍රියාවලියකට කැප වී සිටී.

වසරකට පසුව ද රජය යුක්තිය ප්‍රදානය, සත්‍යය, හානිපූරණය, හා පුනරාවර්තනය නොවීම ගැන සහතික වීමට කැපවී සිටී. කෙසේ වෙතත්, ශ්‍රී  ලංකාවේ සිවිල්  සමාජ කණ්ඩායම් හා වින්දිතයන්  විසින් ප්‍රගතියේ වේගය, සමහර ක්‍රියාවලීන් ගේ විනිවිදභාවය, එම ක්‍රියාවලියේ මුල් අදියරයන්ගේ උපදේශනයන් සඳහා සම්පත් හිඟවීම, සියලු මැදිහත් වීම් වල සංගත විවෘත ප්‍රවේශයක් නොවීම පිළිබඳව වලංගු තැවුලක් ප්‍රකාශ කර සිටිති.

මේ සාරාංශය වින්දිතයන් කෙරේ යුක්තිය තහවුරු කිරීමට ඵලදායී යාන්ත්‍රණ තහවුරු කිරීම, සත්‍යය හා හානිපූරණය (පුනරාවර්තනය නොවීම පිළිබඳ සහතික වීම ඇතුළත්) සඳහා ඇම්නස්ටි ජාත්‍යන්තරයේ නිර්දේශ ඇතුළත්ය. ඇම්නස්ටි ජාත්‍යන්තරය එම චතුර්විධ යාන්ත්‍රණයන් සැලසුම් කිරීම හා දියත් කිරීමේ දී යොදාගත යුතු මූලධර්ම දහයක්  සංක්ෂේප කර ඇත. එම මූලධර්මයන් ඉන් පසුව යෝජිත අධිකරණ යාන්ත්‍රණ, සත්‍යය, යුක්තිය, ප්‍රතිසංධානය හා පුනරාවර්තනය නොවීම පිළිබඳ කොමිසම, අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලයය හා හානිපූරණය සඳහා වන කාර්යාලයය විසින් යොදාගනු ඇත.

INDEX: ASA 37/4902/2016
OCTOBER 2016
LANGUAGE: SINHALA
amnesty.org

AMNESTY INTERNATIONAL